**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කඩිනම් කිරීම පිළිබඳ 2011.05.13 දින පැවති සම්මන්ත්‍රණයේදී එළඹි එකඟතාවයන්**

I. මෙම ක්‍රියාවලියේ ප්‍රමාදයන් අවම කිරීම සහ මනා සම්බන්ධීකරණයකින් සිදු කිරීමට ක්‍රමවේදයක් ලෙස පහත ආයතන හතරෙහි නිලධාරීන් 2011.05.26 දින සිට සෑම බ්‍රහස්පතින්දා දිනකම දිනය පුරාම රැඳී සිටිමින් සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධන කෙටුම්පත් සුපරීක්ෂාකරණයේ නියැලීම.

1. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
2. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
4. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

අදාල අමාත්‍යාංශය මගින් දින වෙන් කරවා ගැනීම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව අමතා කර ගත යුතු වන්නේය.

II. සෑම අමාත්‍යාංශයකම සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීමේ පරිපාටීන් සංශෝධනයේ නියැලෙන කළමනාකරණ සහකාර සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙක් සඳහා වැඩිම සේවක සංඛ්‍යාවක් ඇතුලත් වන PL-1 + PL-3, MN-1 + MN-4 සහ MN-3 + MT-1 යන වැටුප් කාණ්ඩයන් වල බඳවා ගැනීමේ පරිපාටීන් සංශෝධනය සඳහා විස්තර ඇතුළත් කිරීමට ආශ්‍රිත දැනුමක් ලබා දීම.- ජූනි 7, 14, 21

III. 6/2006 චක්‍රලේඛයේ සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීමේ පරිපාටීන්ට අමතරව පවත්නා සෙසු විධානයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ සම්බන්ධීකරණ නිලධාරින් දැනුවත් කිරීම

IV. සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය පිළිබඳ 2011.05.31 දිනට ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශ සම්බන්ධීකරණ නිලධාරීන් විසින් හඳුන්වා දෙන ලද ආකෘතිය මගින් 2011.06.07 දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශය වෙත එවීම.